මෙම පුස්තකය තුළින් අල්ලාහ් ඇතැම් කණ්ඩායම් උසස් කරන අතර.තවත් පිරිසක් එමගින් පහත් කරවයි.

සැබැවින්ම නබි -සල්ලල්ලාහු අලය්හි වසල්ලම්- තුමා පැවසූ බව උමර් ඉබ්නු කත්තාබ් - රළියල්ලාහු අන්හු- තුමා විසින් වාර්තා කරන ලදී. ((මෙම පුස්තකය තුළින් අල්ලාහ් ඇතැම් කණ්ඩායම් උසස් කරන අතර.තවත් පිරිසක් එමගින් පහත් කරවයි.)) [පූර්ව සාධක සහිත හදීසයකි] [ඉමාම් මුස්ලිම් එය වාර්තා කර ඇත]

සැබැවින්ම නබි -සල්ලල්ලාහු අලය්හි වසල්ලම්- තුමා පැවසූ බව උමර් ඉබ්නු කත්තාබ් - රළියල්ලාහු අන්හු- තුමා විසින් වාර්තා කරන ලදී. ((මෙම පුස්තකය තුළින් අල්ලාහ් ඇතැම් කණ්ඩායම් උසස් කරන අතර.තවත් පිරිසක් එමගින් පහත් කරවයි.)) එනම් එහි අර්ථය: ජනයා අල් කුර්ආනය කියවමින් පාරායනය කරමින් එය පිළිපදිති. ඒ අය අතුරින් අල්ලාහ් මෙලොවෙහි හා මතුලොවෙහි උසස් කරන අය වෙති. එමෙන්ම මෙලොවෙහි හා මතුලොවෙහි පහත් කරන අය ද වෙති. කවරෙකු අල් කුර්ආනයේ ඇති තොරතුරු තහවුරු කරමින් ඒ අනුව ක්රියා කරමින් එහි ඇති නියෝග පිළිපදිමින් එය ඇති තහනම් දැයින් වැළකී එහි ඇති මඟපේවීම් ලබා එය පෙන්වා දුන් ගුණාංග ප්රගුණ කරමින් කටයුතු කරන්නේ ද - ඒ සියල්ල යහපත් සාර්ධර්ම වේ.- එවිට අල්ලාහ් ඔහුව මෙලොවෙහි හා මතුලොවෙහි උසස් කරනු ඇත. හේතුව අල් කුර්ආනය දැනුමේ මුලයයි, දැනුමේ උල්පතයි දැනුමේ ආයුෂයි. උත්තරීතර අල්ලාහ් සූරා මුජදලාහි 11 වැනි පාඨයේ මෙසේ සඳහන් කරයි. "ඔබ අතුරින් දෙවියන් විශ්වාස කළවුන් හා දැනුම දෙනු ලැබූවන් තරාතිරිම්වලින් අල්ලාහ් උසස් කරනු ඇත." මතුලොවෙහි සුඛෝපභෝගී ස්වර්ගයන්හි ඇතැම් පිරිස් එමගින් අල්ලාහ් උසස් කරවයි. "එමගින් අල්ලාහ් පහත් කිරීම" යනු, තවත් පිරිසක් එය කියවති. එය අලංකාරව කියවති. ඒ සමගම ඔවුහු ඒ ගැන අහංකාර වෙති. -අල්ලාහ් ආරක්ෂා කරත්වා!- නමුත් එහි සඳහන් තොරතුරු තහවුරු නොකරති. එහි නීති රීති නොහදාරති. ඒ අනුව ක්රියා කිරීමට උඩඟු වෙති. නබිවරුන් හෝ වෙනත් අය පිළිබඳ ප්රකාශිත කතාන්දර, අවසන් දිනය පිළිබඳ හා ඒ හා බැඳුණු තොරතුරු වැනි අල් කුර්ආනයේ යමක් පවසන විට ඒ පිළිබඳව ඔවුහු සැක කරති. විශ්වාස නොකරති. - අල්ලාහ් ආරක්ෂා කරත්වා. එහි ඇති නියෝගයන් පිළිනොපදිති. එහි අති තහනම් දැයින් වැළකී නොසිටිති. බලන්න: රියාලුස් සාලිහීන් හි විග්රහය: (4/645-647)

http://www.sunnah.global/hadeeth/si/show/10119